දෙපාර්තමේන්තු නියෝග 08 / 2017

මගේ අංක : පා/1/2/5/2
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
2017.10. 16

සියළුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම අධ්‍යක්ෂවරුන්/ ප්‍රධාන ඉංජිනේරු/ ප්‍රධාන ගණකාධිකාරී,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
ප්‍රධාන කෘෂි විශේෂඥ / ප්‍රධාන කෘෂි විද්‍යාඥ,
අතිරේක අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්,
සහකාර අධ්‍යක්ෂවරුන්,
ස්ථාන භාර නිලධාරීන්,
පරිපාලන නිලධාරීන්,
ඒකක / ශාඛා ප්‍රධානීන්.

**ස්ථානමාරු සහ විශ්‍රාම ගැනීම් ඉල්ලීම් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.**

දෙපාර්තමේන්තුවේ පාලන අංශය වෙත ඉදිරිපත් වන ස්ථානමාරු සහ විශ්‍රාම ගැනීම් ඉල්ලීම් පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමේදී, ඇතැම් නිලධාරීන් සම්බන්ධව, ඒ වනවිටත් ප්‍රධාන කාර්යාලය වෙත වාර්තා නොවූ විනය ක්‍රියාමාර්ග ඒ ඒ ආයතන මට්ටමින් ක්‍රියාත්මකව පවතින අවස්ථා නිරීක්ෂණය වී ඇත. එවන් අවස්ථාවන්හි දී මතු වන ගැටළු සහගත තත්ත්වයන් වළක්වා ගැනීමේ අරමුණින් මෙම දෙපාර්තමේන්තු නියෝගය නිකුත් කරනු ලැබේ.

02. දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන සියළු ආකාරයේ ස්ථානමාරු ඉල්ලීම් ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීමේදී, අදාල ආයතන / අංශ ප්‍රධානියා / අධ්‍යක්ෂ ගේ නිර්දේශ සහ අනුප්‍රාප්තිකයෙකු සහිතවද / රහිතව ද යන්න පැහැදිළිව සටහන් කර ඉදිරිපත් කළ යුතු ය. එමෙන්ම, ස්ථානමාරු හෝ විශ්‍රාම ගැනීම් ඉල්ලුම්කරු සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ගයක් දැනට ක්‍රියාත්මකව පවතින්නේ ද යන්න සහ ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අදහස් කර තිබේද යන්නත්, ඉල්ලුම්කරුගේ, අදාළ ආයතනයේ සේවා කාලයත් ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතු ය.

03. මේ සම්බන්ධයෙන් ඔබ යටතේ වන සියළුම ආයතන/ මධ්‍යස්ථාන/ ඒකකයන්හි වගකිව යුතු නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, ඒ අනුව ක්‍රියාත්මක වීමෙන් වඩාත් ඵලදායී සේවාවක් ලබා දීමට සහ ලබා ගැනීමට දායක වන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එච්.පී. දයා මැණිකේ සරත්චන්ද්‍ර.
ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ ශ්‍රේණිය).
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන).
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

පිටපත් :
ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය. - කාරුණික දැන ගැනීමට.